**<u>Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විරුද්ධව හිජාස් ඔමර් හිස්බුල්ලා සහා සලීම්කාන් මොහොමඩ් ශාකීල්* (පාස්කු ප්‍රහාරය හා එහි පසුබිම් සිදුවීම් සබැඳිව ගොණු කරන ලද නඩුවකි.)

**Case no (නඩු අංකය):** HC 78/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 ජනවාරි මස 23 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | නදී අපර්ණා සුවන්දුරුගොඩ විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන් ද සිල්වා | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. හිජාස් ඔමර් හිස්බුල්ලා<br>2. සලීම්කාන් මොහොමඩ් ශාකීල් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | පළමු චූදිත වෙනුවෙන් පෙනී සිටීම් පෙර පරිදිම බව දන්වා සිටින ලදී.ජනාධිපති නීතිඥ නලින්ද ඉන්ද්‍රතිස්ස මහතා මෙදින පෙනී සිටින ලදී.<br><br>දෙවන චූදිත වෙනුවෙන්ද පෙනී සිටීම පෙර පරිදිම බව දන්වා සිටින ලදී. නීතිඥ චමින්ද අතුකෝරල මහතා මෙදින පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |

| | | |
|---|---|---|
| **Others (වෙනත් අය)** | නීතිඥ සංගමයෙන් නීතිඥ කෞශල්‍යා නවරත්න මහතා සහ ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහතා පෙනී සිටින බවට සඳහන් කරන ලදී. (නමුදු ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහතා පැමිණ සිටිනු මා දුටුවේ නැත. ඒ පිළිබඳ මාධ්‍යවේදියකුගෙන්ද මා විමසූ කල්හී එම නීතිඥ මහතා පැමිණ සිටියේ නැති බවට මා වෙත එම මාධ්‍යවේදියාද ප්‍රකාශ කරන ලදී.) මාධ්‍යවේදීන්ද, විදේශිකයකුද පළමු විත්තිකරුගේ සහෝදරයකු සහ සහෝදරියක්ද පැමිණ සිටියේය. එමෙන්ම ජනාධිපති නීතිඥ ෆර්මාන් කාසීම් මහතාද පැමිණ සිටියේය. | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා අද දින පැමිණිල්ලේ සාක්ෂි අංක 1 වූ මොහොමඩ් නසාර් මොහොමඩ් මලික්ගෙන් වැඩිදුර හරස් ප්‍රශ්න අසන ලදී.

එහිදී එලෙස හරස් ප්‍රශ්න ඇසීමට පෙරාතුව දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා, පෙර නඩු විභාග දිනයේ පැමිණිල්ලේ සාක්ෂි අංක 1ගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී හෙළි වූ, 2020.03.20 වන දින පැමිණිල්ලේ සාක්ෂි අංක 1 කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) ලබාදුන්නා යැයි සඳහන් ප්‍රකාශය සම්බන්ධයෙන් අධිකරණයට සිහිපත් කරන ලදී. එහිදී අදාළ නිලධාරීන් අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එම 2023.01.22 දිනැති විශේෂ විමශර්න අංශ 3 හි වාර්තාව අනුව 2020.03.20 වන දින ප්‍රකාශයක් ඉදිරිපත් කර නැත යන්න විනිසුරුතුමිය සටහන් කරන ලදී.

එමෙන්ම හරස් ප්‍රශ්න ඇසීමට පෙරාතුව, පෙර දින නඩු විභාගයේදී ප්‍රශ්නගත වූ ඡායාරූප, කැමරාව සම්බන්ධව විත්තිය ඉදිරිපත් කළ නොතිසි ලැබීමෙන් අනතුරුව පියවරගෙන පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන් ද සිල්වා මහතා රස පරීක්ෂක වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරන ලදී. එහි පිටපත් විත්තිය වෙතද ලැබුණු බව දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ප්‍රකාශ කරන ලදී.

අනතුරුව පැමිණිල්ලේ සාක්ෂි අංක 1ගෙන් දෙවන විත්තිකරු වෙනුවෙන් වැඩිදුර හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. එහිදී 2022 ජනවාරි 28 වෙනිදා සාක්ෂිකරු, සුබෙයි සර් සහ අනීස් දේශන දීමට පැමිණි බවත්, එහිදී projector වලින් පලස්තීන ප්‍රහාර පෙන්නලා ඒ පැත්ත අල්ලන්නේ කතෝලික කට්ටියක් යනුවෙන් ප්‍රකාශ කළ නමුත් එය 2020.04.20 CID වෙත කරන ලද ප්‍රකාශයේ එවැනි යමක් සඳහන් නොකිරීම පිළිබඳ නීතිඥ මහතා ප්‍රශ්න කළ විට 2020.04.20 CID වෙත කරන ලද ප්‍රකාශයේදී සාක්ෂිකරු එවැනි යමක් කිවුවේ නැති බවට පිළිගන්නා ලදී. එම අවස්ථාවේදී එය ඌනතාවයක් (omission) ලෙස නීතිඥ මහතා සඳහන් කළ නමුත් විනිසුරුතුමිය එය සාක්ෂිකරු පිළිගත් (admitted) බව ප්‍රකාශ කරන ලදී.

2022 ජනවාරි 28 වෙනිදා සාක්ෂිකරු ප්‍රකාශ කළා යැයි සඳහන් කළ සුබෙයි සර් සහ අනීස් දේශන දීමට පැමිණි බවත්, එහිදී projector වලින් පලස්තීන ප්‍රහාර පෙන්නලා ඒ පැත්ත අල්ලන්නේ කතෝලික කට්ටියක් යනුවෙන් යන කරුණ පිළිබඳ 2020.04.21 CID වෙත කරන ලද ප්‍රකාශයේ සඳහන් නොකිරීම පිළිබඳ නීතිඥ මහතා ප්‍රශ්න කළ විට 2020.04.21 CID වෙත කරන ලද ප්‍රකාශයේදී සාක්ෂිකරු එවැනි යමක් කිවුවේ නැති බවට පිළිගන්නා ලදී.

පාසල් 11ක නම් සඳහන් කරමින් සාක්ෂිකරු පාසල් 11කට මාරු වී තිබ්බා නේද යනුවෙන් නීතිඥ මහතා විමසූ විට ඔව් යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු දෙන ලදී. හිජාස් ඉන්ටනැෂනල් පාසලේදී භාරකරු පහරදුන්නා යැයි සඳහන් කරමින් ගල්කිස්සේ පොලිසියට පැමිණිල්ලක් කිරීම හා එම පාසලෙන් ඉවත් වුණා නේද යන්න සම්බන්ධයෙන් නීතිඥ මහතා හරස් ප්‍රශ්න අසන ලදී. සෑම පාසලකදීම විනය විරෝධී ලෙස හැසිරීම මත පාසල් මාරු කළ බවට නීතිඥ මහතා යෝජනා කළ නමුත් එය සාක්ෂිකරු පිළිනොගත්තේය. මව විසින් සාක්ෂිකරුව පරිවාසෙට භාර දුන් බවටත් මව රට ගිය බවටත් සාක්ෂිකරුගේ පිළිතුරු වලදී සඳහන් විය.

හිජාබ් ඇදගෙන කාන්තාවන් දෙදෙනෙක් (ලතීෆ් සහ සාරා ජස්මීන්) දේශන පැවැත්වීමට පැමිණි බවට සාක්ෂිකරු ප්‍රකාශ කළ බවටත්, එහිදී සාරා ජස්මීන් save the children පුත්තලම කාර්යාලයේ වැඩ කරන බවටත් 1929 ට දුරකථනයෙන් කතා කිරීමෙන් තමන්ට කතා කරන්න පුළුවන් බව ඇය පැවසූ බවටත් සාක්ෂිකරු කළ ප්‍රකාශයක් සඳහන් කරමින් සාක්ෂිකරු එම දුරකථන අංකයට කවදාවත් කතා කළේ නැහැ නේද යන්න නීතිඥ මහතා විමසූ කල්හී එලෙස කතා නොකළ බවට සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී.

එහිදී එම දුරකථන අංකයට විවෘත අධිකරණයේදී ඇමතුමක් ගැනීමට නීතිඥ මහතා උත්සහ ගත් නමුත් විනිසුරුතුමිය එයට අවසර ලබා දුන්නේ නැත.

එම දුරකථන අංකය ළමා ආරක්ෂණ අධිකාරියේ ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි භාර ගන්නා පොදු දුරකථනය බවට නීතිඥ මහතා යෝජනා කරන ලදී. සාක්ෂිකරු එය පිළිගන්නා ලදී.

කාන්තාවන් දෙදෙනෙක් පිළිබඳ කතා කරන්නේ CID හී මෙහෙයවීමක් මත බව නීතිඥ මහතා යෝජනා කළ නමුත් සාක්ෂිකරු එය පිළිනොගත්තේය.

දෙවන විත්තිකරු සිටි පාසලට පැමිණියේ එම කාන්තාවන් දෙදෙනා නොවන බවටත් save the children හී ළමා සුභසාධන සම්බන්ධ කාන්තාවන් දෙදෙනෙක් බවට නීතිඥ මහතා යෝජනා කළ නමුත් සාක්ෂිකරු එය පිළිනොගත්තේය.

අනතුරුව පැමිණිලි පාර්ශවය වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සුදර්ශන් ද සිල්වා මහතා නැවත ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. එහිදී විත්තියේ නීතිඥවරුන් විසින් සාක්ෂිකරු දෙන ලද ප්‍රකාශ පිළිබඳ ප්‍රශ්න ඇසුවා, එම ප්‍රකාශ සිදු කරන ලද්දේ කොහේ හෝ ලියලා තියාගෙනද යන්න සාක්ෂිකරුගෙන් විමසන ලදී. නැහැ මතක තියෙන විදිහට කිවුවේ යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු දෙන ලදී.

විත්තියේ නීතිඥ මහතුන් සාක්ෂිකරු විසින් ප්‍රකාශ ලබා දීමේදී වැදගත් කරුණු කිවුවේ නැහැ යනුවෙන් සඳහන් කර ඇති බවටත්, සාක්ෂිකරුහට මෙහි වැදගත් කරුණු තිබෙනවාද යන්න නියෝජ්‍ය සොලිසිටර් තුමන් විමසන ලදී. එසේ නැති බවට සාක්ෂිකරු පිළිතුරු ලබා දුනී.

පැනලා ආවේ එක් අවස්ථාවකදීද යන්න නියෝජ්‍ය සොලිසිටර් තුමන් විසින් විමසූ කල්හී, එයට පිළිතුරු ලෙස එක පාරක් පැනලා යද්දී අල්ලා ගත්තා, අනිත් පාර පැනලා ආවා යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දුනී. ඒ සිද්ධීන් දෙක සිදු වූ කාල පරතරය පිළිබඳ කරන ලද නැවත ප්‍රශ්නකිරීමේදී, සිද්ධීන් දෙක සිදු වූයේ මාසයක පමණ පරතරයක් තිබියදී යන්න සාක්ෂිකරු සඳහන් කරන ලදී.

පොලිසිය වරින් වර ප්‍රශ්න ඇසුවේ ඇයි කියා දන්නේද යන්න නියෝජ්‍ය සොලිසිටර් තුමන් විමසූ විට විත්තියේ නීතිඥ මහතුන් එම ප්‍රශ්න ඇසීමට විරුද්ධ විය.

21 උදේ වරුවේ පොලීසියේ අය කතා බහ කලාද යනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් තුමන් නැවත ප්‍රශ්න අසන ලදී. වෙන නඩු වලට කටඋත්තර දෙන්න ආපු අයත් හිටියා. ඊට පස්සේ ගත්තා යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දෙන ලදී.

20 වෙනිදා ඡායාරූප පෙන්නුවේද යන්න විමසූ විට, ඔව් ඡායාරූප phone එකකිනුත් පෙන්නුවා, කොළ වලත් කිහිපයක් පෙන්නුවා යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දුනී.තව දුරටත් අසන ලද නැවත ප්‍රශ්න හමුවේ පිළිතුරු දෙමින්, 21 වෙනිදා හාෆ් ෂීට් වල ප්‍රින්ට් කරපුවා පෙන්වා එම ඡායාරූප හඳුනාගත් විට දිනය දමා අත්සන් කළ බවට සාක්ෂිකරු සඳහන් කරන ලදී.

දින ගැන ප්‍රශ්න කළා යනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් තුමන් නැවත ප්‍රශ්න කිරීමට යාමේදී හරස් ප්‍රශ්න වලදී දින ගැන ප්‍රශ්න නොකළ බවට විත්තියේ නීතිඥ මහතුන් නැගී සිට සඳහන් කරමින් එම ප්‍රශ්නය නැඟීමට විරුද්ධ විය. ඉන් අනතුරුව එම ප්‍රශ්නය වෙනත් ලෙසකින් නියෝජ්‍ය සොලිසිටර් තුමන් විසින් නඟන ලදී. එනම්, ප්‍රකාශ ලබා දුන්න දින ගැන ඇහුවා, මේ දින ගැන සටහන් කරගෙන තියෙනවාද, යනුවෙනි. එයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කළේ කියද්දි සිතා බලා දිනය හරි ලෙස සිතුනහොත් හරි බවට සඳහන් කරන බවයි.

සාක්ෂිකරු පාසල් ගණනාවක අධ්‍යාපන කටයුතු කිරීම පිළිබඳව ප්‍රශ්න විමසූ කල්හී එලෙස මාරු වීමට හේතුවූ කරුණු සාක්ෂිකරු සඳහන් කරන ලදී. මුල් කාලයේ පුද්ගලික පාසල් වලට ගිය බවත්, ආර්ථික අපහසුතා මත පාසල් වලින් මාරු වූ බවටත්, ළමා නිවාසෙන් පාසල් වලට ඇමූ බවටත්, සල්ලි තිබෙන අය භාරගෙන සල්ලි ගෙවන බවටත්, එම පොතට දාන මුදල් ඉවර නම් ඔවුන් එයින් අයින්ව වෙනත් එකකට යන බවටත්, හෙම්මාතගම පාසලේදී මව රට සිට පැමිණ ගත් බවටත්, මව රට සිට පැමිණියාම ගන්නවා යනුවෙන් උසාවියේදී දිවුරුම් දී පරිවාසේට සාක්ෂිකරුව භාර දුන් බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී.

සාක්ෂිකරුට අපරාධ චෝදනා තිබේද යන්න නියෝජ්‍ය සොලිසිටර් තුමන් විමසූ කල්හී, අපරාධ චෝදනා නැති බවට සාක්ෂිකරු පිළිතුරු දෙන ලදී.

සාක්ෂිකරු සාක්ෂි දුන් එක් වෙලාවකවත් බොරුවක් කිවුවේද යන්න විමසූ විට, නැත යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දෙන ලදී.

සාක්ෂිකරුහට විත්තිකරුවන් සමඟ තරහක් තිබේද යනුවෙන් විමසූ විට, නැත යනුවෙන් සාක්ෂිකරු පිළිතුරු ලබා දෙන ලදී.

නැවත ප්‍රශ්න කිරීමද අවසන් විය.

සාක්ෂිකරුට බටා මුදල් ලබාගන්නා ලෙස විනිසුරුතුමිය දන්වා සිටින ලදී.

නියෝජ්‍ය සොලිසිටර් තුමන්ගේ ඉල්ලීම පරිදි පැමිණිල්ලේ සාක්ෂි අංක 2, 46, 51 සහ 52 සිතාසි නිකුත් කරන ලෙස විනිසුරුතුමිය ප්‍රකාශ කරයි.

ප්‍රශ්නගත ඡායාරූප පෙන්වා ප්‍රශ්න ඇසීම සම්බන්ධව එකඟතාවයකට පැමිණීම උචිත බවට දෙවන විත්තිකරුගේ නීතිඥ මහතා සඳහන් කළද, නියෝජ්‍ය සොලිසිටර් තුමන් දන්වා සිටින ලද්දේ දින ගණන් සම්බන්ධයෙන් තමන් විරෝධතා නොගන්නා බවත් නිසි සාක්ෂියක් වෙනස් නොකර ඉදිරිපත් කරන ලෙසයි. එමෙන්ම *මහාචාර්ය සරත් විජේසූරිය එදිරිව අනුරුද්ධ පාදෙණිය* නඩුව ආදී නඩු තීරණ පරිගණක සාක්ෂි

සම්බන්ධයෙන් ඇති බවටත් නියෝජ්‍ය සොලිසිටර් තුමන් දන්වා සිටින ලදී. ඒ අනුව පරිගණක සාක්ෂි ඉදිරිපත් කරන ක්‍රමවේදයට ඉදිරිපත් කළ යුතුය යන අදහස සහිතව නියෝජ්‍ය සොලිසිටර් තුමන් සිය කරුණු දැක්වීම සිදු කරන ලදී. ඉහත සඳහන් කරන ලද නඩුවේදී හරස් ප්‍රශ්න ඇසීම පිළිබඳ දක්වා නොමැති බවටත්, මේ සම්බන්ධයෙන් (සාක්ෂි ඉදිරිපත් කිරීමේ හරස් ප්‍රශ්න ඇසීමේදී 1995 අංක 14 දරණ සාක්ෂි විශේෂ විධි විධාන පනත අදාළ වෙනවාද ආදී) හරස් ප්‍රශ්න සම්බන්ධව දැක්වෙන එකම නඩුව *සුනිල් පෙරේරා එදිරිව ගාමිණී සුමණසේකර* නඩුව බවටත් දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සඳහන් කරන ලදී. එමෙන්ම මෙම ඡායාරූප ගත් පුද්ගලයා අත්අඩංගුවේ (අත්අඩංගුවේද රක්ෂිත බන්ධනාගාරයේද යන්න මා හට පැහැදිලිව ඇසුනේ නැත.) සිටින බැවින් එම ඡායාරූප ගත් කැමරාවේ ප්‍රවේශය පොලීසිය හරහා ලබා දුන් බවටත්, ඡායාරූප ගත කළ පුද්ගලයා දිවුරුම් ප්‍රකාශයක් දුන් බවටත්, මෙහිදී තිබෙන තත්ත්වය මත මතයක් ප්‍රකාශ කිරීමට නොහැකි බවටයි රස පරීක්ෂක දක්වන්නේ යනුවෙනුත්, සාක්ෂි ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ ලේකනයක් ලෙස හඳුනාගෙන ඡායාරූප පෙන්වීමේ අයිතිය ලබාදෙන ලෙසත් දෙවන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතා සඳහන් කරන ලදී. (කැමරාව හා ඡායාරූප සම්බන්ධ කර ගැනීමට නොහැකි බව වාර්තාවේ සඳහන් බවට එක් අවස්ථාවකදී යම් පාශර්වයක් සඳහන් කරන ලදී.)

දෙපාර්ශවයේම සියලු කරුණු අසා සිටි විනිසුරුතුමිය, ඒ ඒ අවස්ථානුකූලව නියෝගයක් කරන බවට ප්‍රකාශ කරන ලදී.

මෙම නඩු විභාගය නැවත 2023 වර්ෂයේ මාර්තු 24 කැඳවීමට නියම කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 වර්ෂයේ මාර්තු 24, මාර්තු 27, මාර්තු 28 වැඩිදුර විභාගය සඳහා නියම කරන ලදී.

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**

- https://twitter.com/hejaazh/status/1617501012004327428?t=xNnM1Y9758oiqzgaw7Qqlw&s=08
- https://twitter.com/hejaazh/status/1617499726164946944?t=Cnu9Jo2brFPDWKJ97dvUYA&s=08